# <u>ගෝලීය පරිසරය හා ව්‍යාපාර කටයුතු</u>

හැඳින්වීම - සන්නිවේදන තාක්ෂණයේ හා ප්‍රවාහනයේ දියුණුව මත ලෙව සියළු රටවල් සමීපව සබඳතා පැවැත්නීම ගෝලීයකරණයයි.

එම නිසා ලොව ඕනෑම රටක සිදුවන සිදුවීම් ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම ගෝලීය පරිසරය ලෙස සලකා බැලේ.

අනුමාතෘකාව-
1. ගෝලිය පරිසර බලපෑම් ඉදිරිපත් කිරිම.
2. ව්‍යාපාර කටයුතු කෙරෙහි එම ගෝලීය සිදුවීම් ඇති කෙරෙන බලපෑම දැක්වීම.

## 1. <u>ගෝලීය පරිසර බලපෑම්</u>



**අන්තර්ගතය- C.C. මලවිපතිරණ, I.S.A. , කළාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.**

**සැකසුම- P.L. උෂාන් රසාංජන වීරරත්න, රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, කහවත්ත.**

- ජාත්‍යන්තර රටවල භාණ්ඩ හා සේවා දේශීය වෙළෙඳපොලට පැමිණීම.
- ජාත්‍යන්තර වෙළෙඳාම වැඩි දියුණු කිරීම.
- නවීන යන්ත්‍ර උපකරණ දේශීය වෙළෙඳපොලට පැමිණීම.
- වෙළෙඳපොල තරඟකාරීත්වයක් ඇතිවීම.
- විදේශීය ශ්‍රමය මෙරටට පැමිණීම.
- මෙරට ශ්‍රමිකයන් විදේශ ගතවීම.
- අධ්‍යාපනය සඳහා මෙරටින් විදේශ ගතවන්නන් වැඩිවීම.
- නවීන තාක්ෂණික දැනුම වර්ධනය වීම.
- සන්වාරක කටයුතු වර්ධනය වීම.
- අධ්‍යාපනය සඳහා ඉඩ ප්‍රස්ථාව වැඩිවීම.

## 2. ගෝලීය පරිසරය ව්‍යාපාර කෙරෙහි ඇති කෙරෙන බලපෑම් හිතකර මෙන්ම අහිතකර ද විය හැකිය

- ගුණාත්මක භාණ්ඩ මෙරටට වෙළෙඳපොලට පැමිණීම නිසා වෙළෙඳපොල නටයුතු පුළුල් වේ.
- විදේශ වෙළෙඳපොලට භාණ්ඩ හා සේවා අලෙවි කිරීමට අවස්ථාවක් ලැබීම නිසා වෙළෙඳාම දියුණු වේ.
- තරඟකාරීත්වය වැඩි වේ.
- ගුණාත්මක අමුද්‍රව්‍ය ලබා ගෙන සිදු කරන නිෂ්පාදනවල ගුණත්වය වැඩි වේ.
- වෙළෙඳාම නිදහස්ව සිදු වර ගත හැකි වේ.
- දේශීය ළදරු කර්මාන්තවල පැවැත්මට බාධාවක් ඇති වේ.
- ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වේ.
- විදේශ ප්‍රාග්ධනය රටතුලට ගලා ඒම නිසා දේශීය(කර්මාන්ත) ව්‍යාපාර දියුණු වේ.
- ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම වේ.
- දේශීය සංස්කෘතියට බලපෑම් ඇති වේ.
- විදේශ විනිමය උපයා ගත හැකිය.
- රැකියා අවස්ථා වැඩි වේ.
- පුහුණු හා උගත් ශ්‍රමය පිටරටට ඇදීයාමක් සිදු වේ එවිට පුහුණු ශ්‍රමය ශාඟ විය හැකිය.

අන්තර්ගතය- C.C. මලව්පතිරණ, I.S.A. , කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
සැකසුම- P.L. උෂාන් රසාංජන වීරරත්න, රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, කහවත්ත.